# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

12/1 Pedris Lane, Pedris Rd, Colombo – 03, Sri Lanka
Tel: +94 11 3030462, Fax: +94 11 2564404
**E-mail:** cmev@cpalanka.org **Website:** http://cmev.wordpress.com


**ජනාධිපතිවරණය 2010**
**2010 ජනවාරි 26**
**පැය 06.00 ට**

## යාපනයේ අත් බෝම්බ ප්‍රහාරයක්

අද දින පාන්දර 3.00ට පමණ මෝටර් බයිසිකලයකින් පැමිණි නාඳුනන දෙදෙනෙකු විසින් එ.ජ.නි.ස. උඩුප්පිඩි සම්බන්ධීකාරක සුබ්‍රමනියම් ෂර්මා ගේ නිවසට අත් බෝම්බ ප්‍රහාරයක් එල්ල කර ඇති බවට මැ.ප්‍ර.නි.ම. වෙත තොරතුරු ලැබී ඇත.

පෙ.ව. 04.20ට පමණ සුබ්‍රමනියම් ෂර්මා ගෙන් මේ පිළිබඳව විමසූ විට ඔහු සිදුවීමට අදාල විස්තර තහවුරු කරන ලදී ප්‍රහාරයට අදාලව තර්ජනයක් ඔහුට ලැබී ඇති අතර ජනවාරි 23 වන දින ප.ව. 11.30 ට පමණ නාඳුනන පිරිසක් මෝටර් බයිසිකල්වලින් පැමිණ ඡන්දය භාවිතා නොකරණ ලෙස ජනතාවට දැනුම්දෙන අත්පත්‍රිකා දමාගොස් ඇත. අදදින අත් බෝම්බ ප්‍රහාරයෙන් ඔහුගේ නිවසේ ඉදිරිපස කොටසට අලාභානි සිදුවී ඇතිබව ඔහු ප්‍රකාශකරයි.

මැ.ප්‍ර.නි.ම. විසින් මේ පිළිබඳව පොලිසියෙන් විමසූ අතර තම නම හෙළිකිරීමට අකමැතිවූ නිළධාරියෙකු මැ.ප්‍ර.නි.ම. වෙත ප්‍රකාශ කරනලද්දේ මෙම ප්‍රහාරය පිළිබඳව කිසිදු පැමිණිල්ලක් පොලිසියට ලැබී නොමැති අතර පොලිස් ජංගම කණ්ඩායමක් විසින් මෙම ප්‍රහාරය පිළිබඳව දැනුම්දී ඇතිබවයි. මේ පිළිබඳව පෙ.ව. 04.50ට හා පෙ.ව. 05.10 ට පොලිසිය වෙතින් දුරකථනයෙන් විපසීමේදී මැ.ප්‍ර.නි.ම. වෙත පැහැදිළි වූයේ පොලිසිය වෙත මෙම ප්‍රහාරය පිළිබඳව වෙනත් වැඩිදුර විස්තර පොලිසියට ලැබී නොමැති බවයි.

මැ.ප්‍ර.නි.ම. විසින් නිකුත් කරනු ලබන සියලුම වාර්ථා හා මාධ්‍ය නිවේදන හා මැ.ප්‍ර.නි.ම. සිදුවීම් සිතියම http://cmev.wordpress.com වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. එමෙන්ම http://drop.io/cmevelections වෙත පිවිසීමෙන් පැයෙන් පැය සිදුකරන සජීවී තොරතුරු විකාශනය සිංහල. දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලබාගත හැකිය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

| ආචාර්ය පී සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
|---|---|---|
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |